# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 60 දරන අකුරණ, කුරුගොඩ දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2007 දෙසැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 දෙසැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 60 දරන අකුරණ, කුරුගොඩ දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ: 2007 දෙසැම්බර් මස 13 වන දින]

එල්. ඩී. ඕ.—අයි.එන්. සී. 14/2006

අකුරණ, කුරුගොඩ දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක් නැසීගිය එස්. එම්. මොහිදීන් (මිෂන්) හද්ජියාර්තුමාගේ දරුවන් විසින්, එකී ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරගෙන යාමේ තම පියාගේ අභිලාෂය සඵලාත්මකව මුදුන් පමුණුවාලීම සඳහා ශ්‍රී ලංකාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ, කුරුගොඩ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනයේ කටයුතු ඉහත එකී නැසීගිය එස්. එම්. මොහිදීන් (මිෂන්) හද්ජියාර්තුමාගේ දරුවන් වන (1) මොහොමඩ් මහරූප් මොහොමඩ් මොහිදීන් (2) මොහමඩ් ෆායිස් මොහිදීන් (3) මොහොමඩ් මුබාරක් මොහිදීන් (4) මොහොමඩ් අබ්දුල් කබීර් මොහිදීන් (5) මොහමඩ් සියාඩීන් අහමඩ් මොහිදීන් (6) ඉහිට්ෂාම් මිෂාන් මොහිදීන් (7) මොහොමඩ් සාහි මොහිදීන් යන අයගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය විසින් මෙතෙක් කල් කළමනාකරණය, අධීක්ෂණය සහ පරිපාලනය කර ඇති හෙයින් ද :

එකී ආයතනය පිහිටුවා ඇත්තේ යම් පරමාර්ථ හා කාරණා අරභයා ද එකී පරමාර්ථ හා කාරණා එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ඉටු කර ඇති හෙයින් ද එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 60 දරන අකුරණ, කුරුගොඩ දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මකවීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සහ මේ ආයතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින සියළු තැනැත්තන් ද මෙහි මින් මතු මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" අකුරණ කුරුගොඩ දාරුල් උල්ලූම් අල්-මිසනියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.

2-PL 002467-2,800 (2007/09)

යනුවෙන් සඳහන් කරනු ලබන) දාරුල් උල්ලූම් අල්-මිසතියා අරාබි විද්‍යාලය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද එකී පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) එකී ආයතනය කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම, පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම;

(ආ) "ශුද්ධ වූ කුරානයට" සහ "හදිත්වලට" අනුකූලව අරාබි භාෂාවෙන් ඉස්ලාම් ඉගැන්වීම සඳහා ධෛර්යය දීම ;

(ඇ) "උලමාවරු" නමින් හඳුන්වනු ලබන ඉස්ලාමීය ආගමික උගතුන් බිහි කිරීම සඳහා පහසුකම් සැපයීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති විෂයමාලාවන්ට අනුකූලව ඉස්ලාම් ඉගෙන ගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉඩ ප්‍රස්ථා ලබා දීම හා ඔවුන් ඉස්ලාම් ආගම විෂයය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පරීක්ෂණ සඳහා සූදානම් කරවීම ;

(ඉ) "තජ්විද්" වලට අනුකූලව නොහොත් නිසි උච්චාරණය සහිතව ශුද්ධ වූ කුරානය කට පාඩමින් කියවීම ධෛර්යමත් කිරීම ;

(ඊ) මුස්ලිම් ස්ත්‍රීන්ගේ සමාජයීය, ආර්ථික හා අධ්‍යාපනික දියුණුව උදෙසා වෙනම අංශයක් පිහිටුවා පවත්වාගෙන යාම;

(උ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන්, ණය මුදල්, අත්තිකාරම් හා ප්‍රදාන සැපයීමෙන් ශ්‍රී ලංකාව තුළ සහ විදේශවල දී තම අධ්‍යාපන හා පර්යේෂණ කටයුතුවල යෙදීම සඳහා සුදුසු මුස්ලිම් සිසුනට ආධාර කිරීම සහ ඔවුනට වැඩිදුර ඉගෙනීමට හැකි.වීම සඳහා අවශ්‍ය යයි සැලකෙන වෙනත් උපකාර කිරීම;

(ඌ) ප්‍රදේශයේ ලැබෙන අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන ආදායම් උපදින යම් කර්මාන්තයක නියැලීම සඳහා මුස්ලිම් සිසුන් පුහුණු කිරීම.

4. (1) මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර කවර වූ හෝ සියලු කටයුතු, කාරණා හා දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ බලතල.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ පවරා ඇති බලතලවලට අගතියක් නොවන සේ සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම හා දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, කුළියට දීම, හුවමාරු කිරීම, අන්‍යාකාරයකින් අන්සතු කිරීම හෝ බැහැර කිරීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම සහ ලබා ගැනීම;

(ඈ) දේශීය හෝ විදේශීය ආයතනවලින් හා පුද්ගලයන්ගෙන් ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම ;

(ඉ) කළමනාකරණ මණ්ඩලය විසින් ඉතා හිතකර යැයි තීරණය කරන ආකාරයට සංස්ථාවට අයත් අරමුදල් ආයෝජනය කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගෙන යාමට අවශ්‍ය තැනැත්තන් සේවයට බඳවාගැනීම, සේවයේ යෙදවීම හා ඔවුන්ගේ සේවය තහනම් කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව කළමනාකරණ මණ්ඩලය විසින් කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනි ම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට ලැබිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ පැවති සියලු ණය සහ බැරකම් මෙමගින් පිහිටුවනු ලබන සංස්ථාව විසින් ගෙවා බේරුම් කළ යුතු අතර එදිනට ආයතනයට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන ත්‍යාග, තෑග්ග, තෙස්තමේන්තු නියාදන, පරිත්‍යාග, දායක මුදල් සහ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

9. (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව සංස්ථාව විසින් නිසි අයුරින් ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු හෝ ආශ්‍රිත සාමාජිකයකු හෝ සාමාජිකයන් හෝ විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් එහි නිරවද්‍යතාව තහවුරු කළ යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

10. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුනහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දි හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.